**ශීර්ෂය 259- මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

-------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මාතලේ දිස්ත්‍රික් ලේකම් කර්යාලයේමූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 21 වන දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 මැයි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

-------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳවගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් සිදු කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ දේපල පිරියත උපකරණ වටිනාකම රු.2,387,914,441 ක් ලෙස දක්වා තිබුණද භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එහි වටිනාකම රු.2,406,625,548 ක් වීමෙන් රු.18,711,107 ක නොසැසඳීමක් විය. | මෙම වෙනස නිවැරදි කිරීමට කටයුතු කර දෙන ලෙස 2021 පෙබරවාරි 09 දින විද්‍යුත් තැපැල මඟින් දැනුම් දුන් බව. | ශේෂ අතර වෙනසට හේතු හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ පිළිවෙලින් රු.1,771,919 ක් හා රු.1,489,698 ක් ලෙස සමාලෝචිත වර්ෂයේ අපහරණ වටිනාකම රු.3,261,617 ක් දක්වා තිබුණද භාණ්ඩාගාර මුද්‍රිත සටහනේ එම වටිනාකම රු.16,029,699 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු. 12,768,082 ක නොසැසඳීමක් විය. | පිළිගෙන ඇත. | ශේෂ අතර වෙනසට හේතු හඳුනාගැනීමට කටයුතු කළ යුතු වීම. |

### 1.6.2 අග්‍රිම ශේෂය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව මුළු ලැබීම් රු. 5,649,167,502 ක් වූ අතර අග්‍රිම ගිණුම අනුව මුළු ලැබීම් රු.5,319,887,010 ක් වූයෙන් රු.329,280,492 ක නොසැසඳීමක් පැවතුණ ද වෙනස කුමක් ද යන්න විගණනයට තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. | රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 2/2020 හි 10.1 ඡේදයේ 3.6 සඳහන් ඒ.සී.ඒ - 01 සිට 06 දක්වා වූ අකෘතිය පදනම් කරගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කර ඇත. | ශේෂ අතර වෙනසට හේතු පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිවාඩු ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **නිවාඩු පිළිබඳ ලේඛනය**<br>නාඋල ප්‍රාදේශිය ලේකම් කර්යාලයේ නිවාඩු ලේඛනයට ක්ෂේත්‍ර නිලධාරින්ගේ පෙර ලබාගත් නිවාඩු ඇතුළත් කර නොතිබුණි. | නිලධාරීන් දෙදෙනෙකුගේ නිවාඩු විස්තර ඉල්ලා ඇතත් විස්තර ලැබී නොමැත. රියදුරුගේ නිවාඩු විස්තර මේ වන විට ඇතුළත් කර ඇත. | ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 1.7 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 1.6.4 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මොට්ටුවෙල අමුණ දක්වා යන මාර්ගය සංවර්ධනය කිරීම සඳහා බිල්පත්‍රයෙහි 09 වන අයිතමය යටතේ රු.65,000 ක් ගෙවා තිබුණද එම බිල්පත්‍රයට අදාළ ප්‍රමාණ පත්‍රයෙහි අදාළ මිණුම් කිසිවක් සඳහන් කර නොතිබුණි. | මිනුම් පත්‍රයේ අදාළ අයිතමයේ මිනුම් සඳහන් කර නොතිබීම මඟහැරීමකින් සිදුවී ඇති බව දන්වන අතර ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී කාර්මික නිලධාරියාගෙන් ලබාගත් මිනුම් ක්ෂේත්‍ර පොතේ සඳහන් කර ඇති බව. | බිල්පත්‍රයට අදාළ ප්‍රමාණ පත්‍රයේ මිනුම් සඳහන් කළ යුතු වීම. |
| (ii) | මූල්‍ය ප්‍රකාශන තුළ ඒසීඒ 3 ආකෘතියේ අංක 306/20 දරන අග්‍රිම ගිණුමට අදාළව වෙනත් මූලාශ්‍ර ලැබීම් රු.950,204,213 ක වටිනාකමක් දක්වා තිබුණද එම මූලාශ්‍ර තහවුරු කර ගැනීම සඳහා උපලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මාසික ගිණුම් සාරාංශ පිළියෙල කිරීමේ දී අග්‍රිම හර ලෙස පෙන්නුම් කරන්නේ එම මාසය තුළ එම මූලශ්‍ර වලින් එකතු කළ ආදායම බව. | මූලාශ්‍ර තහවුරු කර ගැනීම සඳහා උපලේඛන ගත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (iii) | අක්මුදල් ගැලපුම් ගිණුමේ දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු. 949,640 ක වටිනාකම සඳහා උපලේඛන ඉදිරිපත් නොකෙරුණි. | දැනටමත් දුම්රිය දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇති අතර හර නිවේදන ලැබුණු පසු විගණනයට වාර්තා කරන බව. | උපලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |
| (iv) | 2020 වර්ෂය සඳහා මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිරිසිදු කිරීමේ කටයුතු සඳහා අවස්ථා 12 කදී රු. 978,000 මුදලක් පුද්ගලික ආයතනයකට ගෙවා තිබුණ ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඔවුන්ගේ පැමිණීම හා පිටවීම පිළිබඳ තහවුරු කිරීම් ලබා ගෙන නොතිබුණි. | සනීපාරක්ෂක නිලධාරීන්ගේ පාලනය ඊට අදාළ සේවා දායක සමාගම විසින් සිදුකරන අතර ප්‍රාදේශීය ලේකම්ට ගිවිසුම්ගත පරිදි සේවාව සැලසී ඇති බව. | අදාළ සේවකයින්ගේ පැමිණීම හා පිටවීම පිළිබඳ තහවුරු කිරීම් ලබාගෙන ගෙවීම් කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු 23 කින් ලැබී තිබුණු ප්‍රතිපාදන රු.10,663,878,000 කින් රු.233,753,000 ක් හෙවත් සියයට 0.02 සිට සියයට 91.2 දක්වා පරාසයක් පමණක් උපයෝජනය කර තිබුණි. | බොහෝ ප්‍රතිපාදන වර්ෂයේ අගභාගයේ දී වෙන්කිරීම නිසා කාලය ප්‍රමාණවත් නොවීම හා අක්මුදල් ලබාගැනීමට අපහසු වීම මත ප්‍රතිපාදන ඉතිරිවී ඇති බව. | ලබා දී තිබූ ප්‍රතිපාදන ඵලදායීව උපයෝජනයට කටයුතු කළ යුතු වීම. |

### 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියකුගේ රු.198,021 ක ණය ශේෂය අය නොවී පැවතුණි. | ණය ශේෂය අයකරගැනීමට කටයුතු කරන බව. | ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| (i) | 2002 ජුනි 19 දිනැති අංක 1/2002 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කළ 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | ප්‍රාදේශිය ලේකම් කාර්යාල 05 ක වර්ෂ 05 කට වැඩි කාලයක් සේවය කර ඇති නිලධාරින් ස්ථාන මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | ස්ථානමාරු ඉල්ලුම් කර ඇතත් ලැබී නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව ස්ථාන මාරු සිදු කළ යුතු වීම. |
| (ii) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ 02(I) ඡේදය | දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අංශය, රත්තොට හා ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් ඇඟිලි සළකුණු සටහන් කිරීම මඟින් කාර්යාලයට පැමිණීම හෝ පිටවීම තහවුරු කර නොතිබූ අවස්ථා පැවතුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඇඟිලි සළකුණු යන්ත්‍රය ඇතැම් අවස්ථාවලදී ක්‍රියාත්මක නොවන අතර ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරියේදී ඇඟිලි සළකුණු යන්ත්‍රය මඟින් පැමිණීම පිටවීම සනාථ කරන ලෙස උපදෙස් ලබාදී ඇති බව හා රත්තොට කොට්ඨාශයේ ආයතන ප්‍රධානියා වශයෙන් කාර්යාල දිනයේ දී පැමිණීමේ ලේඛනයේ අත්සන් කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කාර්යාලවල නිලධාරීන් ඇඟිලි සළකුණු සටහන් කිරීම මඟින් කාර්යාලයට පැමිණීම හෝ පිටවීම තහවුරු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| **(iii)** | 2013 ජූලි 05 දිනැති රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක HAF-3-ADMIN - 02-002 දරන ලිපිය | සෑම ග්‍රාම නිලධාරිවරයෙක්ම අනවසර අල්ලා ගැනීම්/ ඉදිකිරීම් පිළිබඳ වාර්තාවක් දෙසතියකට වරක් ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, මාතලේ හා ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ග්‍රාම නිලධාරීන් විසින් එම වාර්තා යාවත්කාලීනව ඉදිරිපත් කර නොතිබුණි. | දෙසති වාර්තා ලබා දෙන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇති බව. | උපදෙස් ලිපිය ප්‍රකාරව අනවසර අල්ලා ගැනීම් හා ඉදිකිරීම් පිළිබඳ තොරතුරු ලබාගත යුතු වීම. |
| **(iv)** | 2015 ජූනි 12 දිනැති රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක HAF/01/01 දරන ලිපිය | මාසික ඉදිරි වැඩසටහන් පෙර මාසයේ 25 දිනට පෙර හා කළ වැඩ වාර්තා ඊළඟ මාසයේ 05 දිනට ප්‍රථමව ඉදිරිපත් කර අනුමත කරවාගතයුතු වුව ද දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂක හා මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 40 දෙනෙකු ඒ අනුව කටයුතු කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය උපදෙස් ලබා දී ඇති බවත්, මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විගණන නිරීක්ෂණය පිළිගෙන ඇති බව. | ඉදිරි වැඩසටහන් නියමිත දිනට ඉදිරිපත් කළ යුතු වීම. |
| (ආ) | 2016 මාර්තු 31 දිනැති අංක 08/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2.6 ඡේදය | මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි කාර්යාලවල භාණ්ඩ සමීක්ෂණය වසර 10 පමණ කාලයක සිට සිදුකර නොතිබුණි. | සමීක්ෂණය කිරීමට කටයුතු යොදා ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ සිදු කළ යුතු වීම. |
| (ඇ) | මුදල් අමාත්‍යාංශ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2015 ජූලි 07 දිනැති අංක BD/GSP/130/9/14/MC – 11 දරන ලිපියේ 02 ඡේදය | ස්කූටර් ලබාගත් නිලධාරින් දෙදෙනකු රත්තොට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ස්කූටර් සඳහා හිමිකම් නොලබන තනතුරු සඳහා මුදාහැර තිබුන ද ඔවුන්ගෙන් අයවිය යුතු රු.197,000 ක මුදල මාස 29 ක කාලයක් ඉක්ම ගොස් ඇතත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලිපි මඟින් දැන්වුවද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවදුරටත් ගෙවීම් නොකරන්නේ නම් නීති උපදෙස් පතා නීතිමය කටයුතු කරනු ඇත. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය | අතිරික්ත කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවිය නොහැකි බව දක්වා තිබුණ ද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක තනතුරු 07 ක අතිරික්ත කාර්යමණ්ඩලය 19 දෙනෙකු සඳහා 2020 ජනවාරි සිට මාස 10ක කාලයක් වෙනුවෙන් රු.1,870,300 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. | පිළිතුර ලබා දී නොමැත. | අතිරික්ත කාර්ය මණ්ඩලය ස්ථාන මාරුකිරීමට හෝඅනුමත කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**2.4 කොන්ත්‍රාත් සම්බන්ධයෙන් බදු අයකර ගැනීම**

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාළුස්සාගොල්ල ලාක්ෂා ගම්මානයේ පොදු පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරීම ව්‍යාපෘතියේ රු.117,600 ක, ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රමාද ගාස්තු අයකිරීමකිරීමට තිබුණහොත් එම අතරුදවුම් මුදලින් අයකිරීමට කටයුතු කරන බව | ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කිරීම මඟින් ව්‍යාපෘති නියමිත කාලය තුළ ඉටුකර ගැනීමට පෙළඹවිය යුතු වීම. |

**2.5 අවිධිමත් ගනුදෙනු**

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 138 ප්‍රකාරව බලයලත් නිලධාරියා විසින් ගෙවීම් වවුචර් සහතික කළ යුතු වුව ද උකුවෙල හා රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රු.1,043,811 ක වවුචර් සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. | විශාල වවුචර්පත් සංඛ්‍යාවක් ඉදිරිපත් වීම හා කාර්යබහුලතාවය මත සිදු වී ඇති බව. | මුදල් රෙගුලාසි විධිවිධාන අනුව වවුචර් සහතික කර ගෙවීමට කටයුතු කළ යුතු වීම. |

**2.6** වංචනික ස්වරූපයේ ගනුදෙනු

-------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | --------------------------- | ----------- |
| (අ) | මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සපිරිගමක් ව්‍යාපෘතියේ බටගල්ල මාර්ගය අසල කානුවේ හා ඔය පහළ ප්‍රජා ශාලාව වෙත ප්‍රවේශ වන මාර්ගයේ බෝක්කුවේ දිග නියමිත ප්‍රමාණයට වඩා අඩු වීම නිසා රු. 31,266 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අතරුදවුම් මුදල්වලින් කටයුතු කරන බව | ඉටුකරන ලද වැඩ සඳහා පමණක් ගෙවීම් කළ යුතු වීම. |
| (ආ) | පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිල්ලවාන මැදගම මාතෘ සායන මධ්‍යස්ථානය සංවර්ධනය ව්‍යාපෘතියේ පිරිවැය රු. 170,106 ක් වූ ඇස්තමේන්තු අයිතම 21 හි සඳහන් කාර්යයන් වෙනුවෙන් 4.6 mm ඝණකම වීදුරු භාවිතා කළ යුතු වුව ද ඒ සඳහා 2 mm ඝණකම වීදුරු භාවිතා කර තිබුණි. | කාර්මික නිලධාරි කරන ලද පරීක්ෂාවේ දී නියමිත ප්‍රමිතයට ඇති බව | ගිවිසුම අනුව ලබා දී ඇති මිමි සැලකිල්ලට ගෙන ව්‍යාපෘතිය ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සපිරි ගමක් සංවර්ධන වැඩසටහන යටතේ රු.500,000 ක ප්‍රතිපාදන යොදවා දොරකුඹුර උහන ගොඩැල්ල පවුල් 15 ක් සඳහා ජල පහසුකම් සැපයීම ව්‍යාපෘතියේ ජලනල එලීම හා පස් කැපීම වෙනුවෙන් රු. 29,538 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | ලිපිගොනු ලද පසු ඉදිරි කටයුතු සිදුකරනු ලබන බව | ඉටුකරන ලද කර්මාන්තවල මිමි ලබා ගැනීමේදී ඉටුකරන ලද අයිතම වල මිමි නිවැරදිව ගණනය කළ යුතු වීම. |
| (ඈ) | දිස්ත්‍රික් ලේකම්වරයා විසින් අනුමත කර තිබූ අතිකාල පැය ගණන ලබාගෙන ඊට අමතරව එම කාල පරිච්ඡේදය සඳහාම රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 04 දෙනෙකු සඳහා රු.15,606 ක් වූ නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. | පූර්ව අනුමැතිය ලබා ගෙන ඇත. | එකම කාලපරිච්ඡේදය සඳහා අතිකාල හා නිවාඩු දින වැටුප් දෙකම ලබා නොදිය යුතු අතර වැඩිපුර ගෙවීම අයකරගත යුතු වීම. |

**2.7 තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ නායයාම හේතුවෙන් ජනතාව නැවත පදිංචි කිරිම යටතේ සකස් කරන ලද නිවාසවල යෝග්‍යතා සහතික ලබා ගැනීම සඳහා මාස 07 සිට වර්ෂයක් දක්වා කාලයක් ප්‍රමාද වීම හේතුවෙන් ඒ සඳහා ලද රු.300,000 ක මුදල පොදු තැන්පත් ගිණුමෙහි රඳවා තිබුණි. | ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් යෝග්‍යතා සහතික ලැබුණු පසුව තැන්පත් මුදල් නිදහස් කිරීමට කටයුතු කරන බව. | නිවාස වල යෝග්‍යතාවය තහවුරු කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 දැක්ම හා මෙහෙවර**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත නිපුණතා සංවර්ධන නිලධාරි ,දේශීය වෛද්‍ය, විද්‍යා හා තාක්ෂණ,සමාජ සේවා,බුද්ධ ශාසන හා සංස්කෘතික නිලධාරින්ගේ ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාවන් පරික්ෂාවේ දී අරමුණුගත කාර්යයන් ඉටුවන පරිදි සකස් කර නොතිබුණි. | 2022 වර්ෂය සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අදාළ නිලධාරීන් හට උපදෙස් ලබාදී ඇති බව. | සියලුම නිලධාරීන් විසින් අරමුණුගත කාර්යයන් ඉටුවන පරිදි ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව සකස් කළ යුතු වීම. |

**3.2** **සැලැසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාලෝචිත වර්ෂය තුළදී "සපිරිගම" යටතේ වූ සංවර්ධන ව්‍යාපෘති 211 කින් ව්‍යාපෘති 152 ක් සඳහා කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම් ගතවී තිබුණේ වර්ෂයේ අවසන් මාස දෙක තුළබැවින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු කාල රාමුවක් අනුගමනය කර නොතිබුණි. | ප්‍රතිපාදන අවසන් කාර්තුවේ දී ලැබීතිබීම හේතුවෙන් වැඩි ව්‍යාපෘති ප්‍රමාණයක් අවසන් කාර්තුවේ දී සිදු කිරීමට සිදුවී ඇති බව. | වර්ෂයේ මුල්භාගයේ දී ගිවිසුම් ගත වීමට සුදුසු වැඩපිළිවෙලක් සැකසිය යුතු වීම. |

**3.3** **කාර්යභාරයන් ඉටු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2020 වර්ෂය තුළ ඉටු කිරීමට යෝජිත ව්‍යාපෘති 177 අතුරින් රු. 26,500,000 වටිනා ව්‍යාපෘති 27 ක් ක්‍රියාත්මක නොකර ඒ වෙනුවට වෙනත් ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. එම හේතුවෙන් මහජන අවශ්‍යතාවය අනුව ග්‍රාමීය නියෝජිතයන් හදුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | චක්‍රලේඛයේ අංක 08 යටතේ යෝජනා ප්‍රමුඛතා කර ඇත. ප්‍රමුඛතාවය සඳහන් නොවූ යෝජනා ඉටු නොකළ අතර ඊළඟ ට පවතින යෝජනාව අනුමත කර ක්‍රියාත්මක කරන ලද බව හා තාක්ෂණික ගැටළු හේතුවෙන් ද යෝජනා ක්‍රියාත්මක කිරීමේ ගැටළු ඇති වූ බව. | යෝජිත ව්‍යාපෘති ඉටු කිරීම පිළිබඳ අවධානය යොමු කළ යුතු වීම. |

**3.4** **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

**-----------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------------- | නිර්දේශය<br>------------ |
| --- | --- | --- | --- |
| (අ) | රත්තොට මාඋස්සාගොල්ල ලාක්ෂා ගම්මානයේ පොදු පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරීම ව්‍යාපෘතියේ ගලිකවර විවෘත කළ නොහැකි වන ලෙසට කොන්ක්‍රීට් කර තිබීම , ඇලුමිනියම් දොරවල් හා ජනේල සඳහා බීඩින් පටි නිසි ලෙස යොදා නොතිබීම පිළිබඳව සැලකිලිමත් නොවී ගෙවීම් සහතික කර තිබුණි. | අධීක්ෂණය අතපසුවීම පිළිගන්නා අතර තත්ත්ව වාර්තාවක් කැඳවා ඇති බව. | ව්‍යාපෘතියේ සියලුම කොටස් සම්පූර්ණ කළපසුව ගෙවීම් සහතික කළ යුතු වීම. |
| (ආ) | දිස්ත්‍රික් පුහුණු අංශය මඟින් පරිගණක සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා 2020 ක්‍රියාකාරී සැලැස්ම තුළින් ක්‍රියාකාරකම් 4 ක අපේක්ෂිත පුහුණු සංඛ්‍යාව 1,846 ක් සැලැසුම් කර තිබුණ ද 2020 සැප්තැම්බර් 30 දින වන විට තත්‍ය පුහුණු සංඛ්‍යාව 216 ක් විය. | ප්‍රතිපාදන ප්‍රමාණය සීමිත වීම හා කොවිඩ් 19 වෛරස ව්‍යාප්තිය බලපෑ බව . | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළයුතු වීම. |
| (ඇ) | මාතලේ හුලංගමුව දකුණ - හෙට්ටියාවත්ත හරහා අස්වැද්දුම ගමට පිවිසෙන මාර්ගය සංවර්ධන ව්‍යාපෘතියේ පාලම් සැලැස්ම අනුව පළල හා දකුණු කොටසේ දිග පිළිවෙලින් 16' හා 26' ලෙස සැලැසුම් කර තිබුණ ද භෞතික පරීක්ෂාවේ දී එම ප්‍රමාණයන් අඩි 13 අඟල් 8 සහ අඩි 22 අඟල් 8 ක් ලෙස නිමකර තිබූ අතර අත්වැටෙහි වම්පස මීටර් 9.8 ක් සහ දකුණු පස මීටර් 17.8 ක් සකසා නොතිබුණි . | එම වර්ෂයේ සම්පූර්ණයෙන්ම කිරීමට නොහැකි වුව ද 2020 වර්ෂයේ එහි අත් වැට යොදා ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කර ඇති අතර වැඩිදුරටත් පරීක්ෂාකිරීමට සටහන් තබාගත් බව. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය නිම කළ යුතු වීම. |

**3.5** **ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ස්ථාපිත කර තිබුණු ස්මාර්ට් ශ්‍රී ලංකා ප්‍රාදේශීය ඒකකය මඟින් ග්‍රාමීය දත්ත කළමනාකරණ පද්ධතියට දත්ත ඇතුළත් කිරීම සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මාසයෙන් පසුව යාවත්කාලීන කර නොතිබුණි. | අන්තර්ජාල පහසුකම් වෙනුවෙන් මාසික බිල්පත් ගෙවීම් කිරීමට ප්‍රතිපාදන 2020 වර්ෂය නොලැබුණු බැවින් යාවත්කාලීන කිරීමට නොහැකි වූ බව | අපේක්ෂිත ප්‍රගතිය ඉටුකර ගැනීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වීම. |

**3.6** **ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2019 වර්ෂයේ දී ගිවිසුම්ගත වී ඇති රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාළුස්සාගොල්ල ලාක්ෂා ගම්මානයේ පොදු පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරීමේ ඉතිරි වැඩ කොටස් නිම කිරීම වෙනුවෙන් 2019 නොවැම්බර් 15 වන දින සිට 2019 දෙසැම්බර් 15 වන දින දක්වා දින දීර්ඝ කර තිබුණ ද 2020 පෙබරවාරි 11 වැනි දින වන විටද වැඩ නිම කර නොතිබුණි. | පිළිතුර ලබා දී නොමැත. | ගිවිසුම්ගත කාලය තුළ වැඩ නිම කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සපිරි ගමක් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අනුමත රු.3,000,000 ක් වටිනා ව්‍යාපෘති 5 ක් සඳහා කොන්ත්‍රාත්තු පිරිනැමීම පමණක් සිදු කර තිබුණි. | පිළිතුර ලබා දී නොමැත. | පිරිනමන ලද ව්‍යාපෘති ගිවිසුම්ගත කාලය තුළ නිම කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පල්ලේපොළ නගර සංවර්ධනයට ඉඩම් අත්පත් කර ගැනීම හා විසල් මාතලේ ජල සම්පාදනය යටතේ ජල ටැංකිය වෙනුවෙන් ඊට අදාළ වන්දි මුදල් ගෙවා තිබුණ ද ඉඩම්වල ලියාපදිංචි කටයුතු අවසන් කර නොතිබුණි | පිළිතුර ලබාදී නොමැත. | කඩිනමින් ඉඩම්වල ලියාපදිංචි කටයුතු සිදු කළ යුතු වීම. |

**3.7 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපෘතිය ශක්තිමත් කිරීම සඳහා 2018 හා 2019 වර්ෂවලදී ලබාදී තිබූ මුදලින් 2020 දෙසැම්බර් 31 දින වන විට රු.666,935 ක මුදලක් නිෂ්කාර්ය පැවතුණි. | ග්‍රාම ශක්ති ජනතා සමිතියේ පැවැත්ම සඳහා අවශ්‍යතාවක් මත මහසභාවේ එකඟතාවය අනුව මුදල් නිදහස් කිරීම සිදු කළ බව, 2020 කොවිඩ් වසංගතය නිසා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක නොකළ බව, ප්‍රධාන බැංකු ගිණුමේ ධාරිතා සංවර්ධන අරමුදලට අදාළ මුදල් පවතින අතර වාර්ෂික පොලී එකතුවීම් හේතුවෙන් අරමුදල් ප්‍රමාණය වැඩි වී ඇති බව. | ලැබී ඇති ප්‍රතිපාදන ඵලදායි ව්‍යාපෘති වෙනුවෙන් යෙදවිය යුතු වීම. |
| (ආ) | උකුවෙල හා රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල 2019 වර්ෂයේ "ගම්පෙරළිය වැඩසටහන" යටතේ මිලදී ගන්නා ලද රු.26,642,202 ක් වූ සෙවිලි තහඩු හා උපකරණ නිෂ්කාර්යව පැවතුණි. | උකුවෙල ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය දැව ලබාගැනීම් හා ශ්‍රමය ලබා ගැනීමේ අපහසුතාවය මත ක්‍රියාත්මක කිරීමට නොහැකි බව හා අවශ්‍ය උපාංග ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇති බව ද, රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද අක්මුදල් ලැබීමේ ප්‍රමාදය මත අවශ්‍ය උපාංග ලබාගැනීම සඳහා ඉල්ලුම් කර ඇතත් ලැබී නැති බව. | ලැබී ඇති තහඩු බෙදා දීමට කටයුතු කළ යුතු වීම. |

**3.8 වෙනත් නිරීක්ෂණ**

---

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාතලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් අඩු ආදායම්ලාභී පවුල්වලට එළුවන් බෙදා දීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී ගාල් නිසි පරිදි ඉදිකර නොතිබුණි. 2020 ජූලි 07 දින වන විට පැටවුන් 04 ක් මිය ගොස් තිබූ අතර නැවත පැටවුන් තිදෙනෙකු මිලදී ගෙන තිබුනි. රජයට සිදුවී ඇති පාඩුව රු. 52,500 ක් විය. | එළුගාල් සකස් කිරීම පිළිබඳ පුහුණුවක් ලබාදී ඇති බව හා නියමිත පරිදි එළුගාල් සකස් කිරීමට කටයුතු කරමින් සිටින බව . | ව්‍යාපෘති පිළිබඳ පසු විපරම් කළ යුතු වීම. |

**3.9 ප්‍රසම්පාදනයන්**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රත්තොට මාඋස්සාගොල්ල ලාක්ෂා ගම්මානයේ පොදු පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරීම ව්‍යාපෘතියසඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීම් යොදාගත යුතුව තිබුණ ද සීමිත /පාලිත ජාතික ලංසු කැඳවීමේ ක්‍රමය භාවිතා කර ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවකු නොවූ ආයතනයට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. | සීමිත කාලය හේතුවෙන් CIDA ලියාපදිංචි මෙම කාර්යාලය මගින් ක්‍රියාත්මක ව්‍යාපෘති සාර්ථකව නිම කිරීමට කොන්ත්‍රාත් දායකත්වය සපයන ලද දිස්ත්‍රික්කයේ පදිංචි කොන්ත්‍රාත්කරුවකු වෙත වෙළඳපල සැදහුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවීමට තීරණය කර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහට අනුකූලව කොන්ත්‍රාත් පිරිනැමීමට කටයුතු කළ යුතු වීම . |
| (ආ) රත්තොට මාඋස්සාගොල්ල ලාක්ෂා ගම්මානයේ පොදු පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරීම ව්‍යාපෘතියේ පිරිවැය ඇස්තමේන්තුව ප්‍රකාරව හා කොන්ත්‍රාත් ගිවිසුම පරිදි නියමිත පිරිවිතරයන්ට අනුකූලව හා නියමිත කාලපරිච්ඡේදය තුළ ව්‍යාපෘතිය ඉටු කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වී තිබියදීත් රු.මිලියන 3.5 ක් වූ ප්‍රතිපාදනයෙන් ඉතිරි වැඩ කොටස් නිම කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව නැවත එම කොන්ත්‍රාත්කරු වෙතම ලබාදී තිබුණි. | ලංසු කැඳවීමට ප්‍රමාණවත් කාලයක් නොවූ අතර ඇස්තමේන්තුව අනුව කොන්ත්‍රාත්තුව කිරීමට එකඟ වූ බැවින් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ ඇහැරුන්ද වැව ප්‍රතිසංස්කරණයට අදාළ ප්‍රසම්පාදන දැන්විම අනුව අදාළ ක්ෂේත්‍රයේ 2016, 2017, 2018 යන වර්ෂ සඳහා මිලියන 5ක් ඉක්ම වූ ව්‍යාපෘති 03ක් සාර්ථකව නිමකර තිබීම, පසුගිය වසර තුන ඇතුළත ඉටුකළ කර්මාන්ත වල වාර්ෂික ධාරිතාවය අවම වශයෙන් රුපියල් මිලියන 15 ක් වීම දක්වා තිබුණ ද එම කරුණු සනාථ නොවූ කොන්ත්‍රාත්කරුවෙකු වෙත ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. | පැවති සීමිත කාලසීමාව අනුව සියළුම ප්‍රසම්පාදන කොන්දේසි වලට අදාළ තෝරාගැනීම දුෂ්කර වූ අතර තාක්ෂණික හා මූල්‍යමය හැකියාව පැවති අවම ලංසු ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුව පිරිනමා ඇති බව. | නියමිත සුදුසුකම් සහිත පලපුරුදු කොන්ත්‍රාත්කරුවකු තෝරාගත යුතු වීම. |
| (ඇ) | ඇහැරුන්ද වැව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන දැන්වීමේ 05 ඡේදය පරිදි පසුගිය වසර තුන ඇතුළත අදාළ ක්ෂේත්‍රය ඉටුකරන ලද රුපියල් මිලියන 5 ඉක්ම වූ ව්‍යාපෘති සඳහා සේවා යෝජකයින්ගෙන් ලබා ගත් වැඩ අවසන් සහතික ඉදිරිපත් කළ යුතු වුවත් එම අවශ්‍යතාවය ඉටුකර නොතිබිය දී මෙම කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. | සියළුම ප්‍රසම්පාදන කොන්දේසි වලට අදාළව කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීම දුෂ්කර වී ඇති බව. | කොන්ත්‍රාත්තු පිරිනැමීමට පෙර වැඩ අවසන් සහතික ලබා ගත යුතු වීම. |

## 3.10 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගුරු වෘත්තිය සඳහා මුදා හැර විගණිත දිනට වර්ෂ 03 ත් වර්ෂ 06 ත් අතර කාලයක් ඉක්ම ගොස් තිබූ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිළධාරීන් 08 දෙනෙකුගෙන් අයකර ගත යුතු රු.995,180 ක මුදල 2021 පෙබරවාරි 25 දින වන විට ද අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මාසික වාරික වශයෙන් අයකර මුදල් එවන ලෙස අදාල ආයතන වෙත දන්වා ඇති බව. | අධ්‍යාපන කාර්යාලය දැනුවත් කර අදාළ මුදල් අයකරගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාමිකයන් 03 දෙනෙකුගේ හැඳුනුම්පත් අංක විගණිත දිනය වූ 2021 පෙබරවාරි 23 දින වන විටත් දත්ත පද්ධතියට ඇතුළත් කර නොතිබුණි. | හැඳුනුම්පත් සකස්කිරීමට පියවර ගෙන ඇති බව. | විශ්‍රාමිකයින්ගේ ලිපිගොනු කඩිනමින් යාවත්කාලීන කළ යුතු වීම. |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ක්‍රම සම්පාදන අංශයේ පවත්වාගෙන යනු ලබන ණය ඉල්ලුම් පොරොත්තු ලේඛණයේ නිලධාරීන් ණය ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ දිනය සටහන් කර නොතිබීමෙන් පොරොත්තු ලේඛනයේ සඳහන් නම් ලැයිස්තුවේ අනු පිළිවෙලහි නිරවද්‍යතාවය තහවුරු නොවුණි. | දිනය සටහන් කිරීමට කටයුතු කර ඇති බව. | ඉල්ලුම්පත්‍රය ඉදිරිපත්කළ දිනය දින මුද්‍රාව තබා සඳහන් කළ යුතු වීම. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

**---------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ---------------------------------- | ------------ |
| (අ) | 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් වැඩසටහන් 08 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය මත ප්‍රතිපාදන නොමැතිවීම බලපෑ බව. | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් වූ වැඩසටහන් ඉටුකළ යුතු වීම. |
| (ආ) | 2020 වර්ෂයේ ප්‍රගතිය සලකා බැලීමේ දී වැඩසටහන් 05 කට අදාළව කිසිදු ප්‍රගතියක් නොපෙන්වූ අතර වැඩසටහන් 08 ක් සම්බන්ධයෙන් සියයට 50කට අඩු ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය නිසා ව්‍යාපෘති කිරීමට නොහැකි විය. | අපේක්ෂිත ප්‍රගතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංශ 21 කට අදාළව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණ ද 2020 වර්ෂයෙහි ප්‍රගතිය දැක්වීමේ දී අංශ 11 ක් සම්බන්ධයෙන් පමණක් ප්‍රගතිය දක්වා තිබුණි. | ඉදිරියේ දී සියලු අංශ ඇතුළත් කරන බව | සෑම අංශයකම ප්‍රගතිය දැක්විය යුතු වීම. |

**5.** **යහපාලනය**

--------------

**5.1** **මහජනයා වෙත සේවා ඉටු කිරිම**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------------ | ------------ |
| (අ) | යටවත්ත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ සිදු කරන පාරිසරික ක්‍රියාකාරකම් සම්බන්ධ ගැටළු 12 ක් විසඳී නොතිබුණි. | ගැටළු 14 න් 2 ක් විසඳා ඇති බව. | පාරිසරික ක්‍රියාකාරම් සම්බන්ධ ගැටළු විසදිය යුතු වීම. |
| (ආ) | ගලේවෙල හා නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල රු. 232,000 ක වටිනාකමකින් යුතු පෝෂණ මල්ල ලබානොගත් අවස්ථා 116 කට අදාළ නිලධාරීන් විසින් ඒ පිළිබඳ පසුවිපරම් නොකිරීම හේතුවෙන් මෙම ප්‍රතිලාභය මව්වරුන්ට අහිමිවී තිබුණි. | වවුචර්පත් අස්ථානගත වී තිබීම, කොට්ඨාශයෙන් පිටතටගොස් තිබීම නිසා ප්‍රතිලාභ ලබාගෙන නොමැති බව. | පෝෂණමල්ල ලබාගැනීම පිළිබඳ පසුවිපරම් කළ යුතු වීම. |

**6.** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය**<br>**----------------------** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>**------------------------------** | **නිර්දේශය**<br>**----------** |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ඒ යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 හි අනුමත කාර්යමණ්ඩලය 1867 න් පුරප්පාඩු 239 ක් හා අතිරික්ත 18 ක් පැවතුණි. | පුරප්පාඩු හා අතිරික්තයන් පිළිබඳ තොරතුරු ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන බව. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු අතර අතිරික්තයන් අනුමත කර ගැනීමට හෝ ස්ථානමාරු කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | මාතලේ දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අංශයේ සහකාර අධ්‍යක්ෂ සැලැසුම් (අධි සේවක) පුද්ගලික වන සේ අනුමත කර ඇතත්, ඊට අමතරව සහකාර අධ්‍යක්ෂ සැලැසුම් (අධි සේවක ) තනතුරක් අතිරික්තව පවත්වාගෙන යමින් ඒ සඳහා 2019 ජනවාරි සිට 2020 දෙසැම්බර් දක්වා රු. 1,872,083 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | පුරප්පාඩු හා අතිරික්තයන් පිළිබඳ තොරතුරු ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන බව. | අතිරික්ත නිලධාරීන් පුරප්පාඩු ඇති ස්ථානවලට ස්ථාන මාරු කළ යුතු වේ. |